# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1822/27 - 2013 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2013.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2013 අංක 02 දරණ ගෙවල් කුලී (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් 2013 ජුනි 27 වැනි දින සම්මත කරන ලදුව 2013 ජූලි 15 වැනි දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
ලේකම්,
ඌව පළාතේ පළාත් සභාව.

2013 ජූලි මස 29 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

***2013 අංක 2 දරණ ඌව පළාතේ පළාත් සභාවේ ගෙවල් කුලී (සංශෝධන) ප්‍රඥප්තිය***

2010 අංක 05 දරණ ඌව පළාත් ගෙවල් කුලී ප්‍රඥප්තියේ 5(2) උප වගන්තිය සංශෝධනය කිරීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2013 අංක 2 දරණ ගෙවල්කුලී (සංශෝධන) ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලැබේ. එය ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට හෝ තීරණය කරන ලද දින සිට ක්‍රියාත්මක වන්නේය. (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)

2. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන 2010 අංක 05 දරණ ඌව පළාතේ ගෙවල්කුලී ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වැනි උප වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ ; (ප්‍රධාන ප්‍රඥප්තියේ 5(2) උප වගන්තිය සංශෝධනය කිරීම.)

"අදාළ පනත්වල අමාත්‍යවරයා විසින් සාදනු ලැබ තත්කාලයෙහි බල පවත්නා නියෝග පළාත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ලෙස සැලකිය යුතු අතර, අදාළ පනත් ඌව පළාත තුළ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ක්‍රියාත්මක කිරීමේදී එම පනතේ යටතේ පළාත් අමාත්‍යවරයා විසින් පනවා ඇති හෝ මතුවට පනවනු ලබන නියෝග අනුව ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතුය. එසේම තත්කාලයේ බල පවත්නා නියෝග අවලංගු කිරීමට, වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ නව නියෝග සෑදීමට පළාත් අමාත්‍යවරයාට හැකිවිය යුතුය."

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

3. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

08 - 779

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.